# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,579 — 1958 නොවැම්බර් 7 වැනි සිකුරාදා—7.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 2469 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 2471 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 2471 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 2479 | විවිධ දැන්වීම් ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරු වලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරු වලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.


2469—ජේ.ඇන්.බී 8210—5,943 (10/58)

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නවප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර 24 වැනිද හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදිප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධසේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුවුදයක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර 3 වැනි දිනත්. ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද"යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### සංචාරක බංගලා භාරකරු තනතුරු

වර්ෂයකට රුපියල් 600න් පටන්ගෙන රුපියල් 12 වාර්ෂික වැඩිවීම්වලින් රුපියල් 804 දක්වා නගින පඩි ක්‍රමයට සංචාරක බංගලා භාරකරුවන්ගේ තනතුරු 3ක් සඳහා ඉල්ලුම් පත්‍ර 1958 නොවැම්බර් 29 වැනි සෙනසුරාදා අ. භා. 1 දක්වා ම විසින් භාරගනු ලැබේ.

2. සංචාරක බංගලා භාරකරුවන්ට ගෙවල් කුලී ගෙවනු නොලැබේ. ගෙවල් කුලී ගෙවීමෙන් නිදහස්ව නතරවීමට ඉඩකඩ සංචාරක බංගලාවේ ම සලසනු ලැබේ.

3. සංචාරක බංගලා භාරකරුවන් සතියකට දින හතක් වැඩ කළ යුතු සේවකයින්ගේ ගණයට වැටෙන නිසා ඔව්හු නිදහස් දුම්රිය බලපත්‍ර හෝ රජයේ නිවාඩු දිනවල නිවාඩු හෝ ලැබීමට සුදුස්සෝ නොවෙති.

4. අයැදුම්කරුවන් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අන්තිම දිනයේ වයස අවුරුදු 25ට නො අඩුවූද, අවුරුදු 45ට නො වැඩිවූද ලාංකිකයන් විය යුතුයි.

5. අයැදුම් කරුවන් ආහාර පිසීම (පෙරදිග හා ඉංග්‍රීසි ක්‍රම අනුව) ගැන මනා පළපුරුද්දක් ඇති, සිංහල/දෙමළ හත්වන පන්තිය සමත්වූ, ඉංග්‍රීසි සාමාන්‍ය දැනීමක් ඇති අය විය යුතුයි. නානායම් පොළවල හෝ වෙනත් ස්ථානවල කෑම සැපයීම පිළිබඳ පළපුරුද්දක් ඇති කුස්සියේ සහ ගේ දොරේ සෞඛ්‍යය සහ නියම අන්දමට අමුත්තන් පිළිගැනීම පිළිබඳ මනා දැනීමක් ඇති අයැදුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

6. තෝරා ගනු ලබන අයැදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මූදල් රෙගුලාසි සහ ආණ්ඩුවේ අනෙකුත් රෙගුලාසිවලටද යටත් විය යුතුයි.

7. පහත සඳහන් සහතිකවල ආපසු නොලැබෙන පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පතට අමුනා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. බවුතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවල සඳහන් කළයුතු සඳහා නිකුත් කරනු සහතික පිළිගනු නො ලැබේ).

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය, සහ

(ඇ) ඉල්ලුම්කරුගේ චරිතය සහ සුදුසුකම් පිළිබඳව මෑතදී ලබා ගත් සහතික දෙකක්.

8. (අ) මෙම තනතුර විශ්‍රාම වේතනාර්හ නොවේ. තෝරාගනු ලබන අයැදුම්කරුවන් අවුරුදු තුනක පරීක්ෂණාත්මක කාලයකට යටත් ව සේවය කළ යුතු යි.

(ආ) තෝරාගනු ලබන අයැදුම්කරුවන් මුදලින් රුපියල් 250 ක් ඇප තැබිය යුතුයි.

(ඇ) තෝරාගනු ලබන අයැදුම්කරුවන්ට මෙම දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලබන ඕනෑම සංචාරක බංගලාවක සේවය කිරීමට සිදුවිය හැක.

9. ඉල්ලුම්පත් මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ආකාරයට සකස්විය යුතුයි. මෙම කාර්යාලයෙන් විශෙෂ ආකෘති පත්‍ර සපයනු නො ලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවැනි ඡෙදයේ මුල ප්‍රසිද්ධ කොට ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

11. ඉල්ලුම්පත්‍ර පහත අත්සන් කරන අයට පෞද්ගලික ව නොව, කොළඹ, තැපැල් පෙට්ටිය අංක 500, වාරිමාර්ග අධ්‍යක්ෂකට එවිය යුතුයි.

නි. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්‍ෂක වෙනුවට.

නොවැම්බර් 3 වැනි දින, කොළඹදී ය.

### සංචාරක බංගලා භාරකරු පදවිය සඳහා ඉල්ලුම් පත්‍රය

1. දැන්වීමට සම්බන්ධය :————.

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

   පුරවැසි බව (මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ විස්තර කර ඇති අයුරු ලාංකිකයෙක්ද නැද්ද යන බව සඳහන් කරන්න) :————.

3. ලිපිනය :————.

4. අයැදුම්කරු උපන් දිනය :————.
   ස්ථානය :————.

5. අයැදුම්කරුගේ පියා උපන් දිනය :————.
   ස්ථානය :————.

6. විවාහක ද, අවිවාහක ද යන බව :————.

7. අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සමත්වූ විභාගය (දිනය සහිතව) :————.

8. ඉගෙණීම ලැබූ පාසැල් සහ පාසැලෙන් අස්වූ දිනය :————.

9. (අ) පාසැලෙන් අස්වීමට පසු කළ රක්ෂාවල්, (දින සහිතව) සහ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

   (ආ) කලින් රජයේ සේවයෙහි යෙදී සිටියෙහි නම්, සේවය නතර කිරීමට හේතුව සහිතව එම සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න.

   (ඇ) සේවාමුක්ත භටයෙක් නම්, සේවයෙහි යෙදී සිටි අංශය, තනතුර, සේවයට බැඳුණු දිනය සහ ඉන් අස් වූ දිනය : ————.

10. කියවීම, ලිවීම සහ තේරුම්කර දීමේ ප්‍රවීනතාවය :

(අ) සිංහල/දෙමළ :————.

(ආ) ඉංග්‍රීසි :————.

11. විශෙෂ සුදුසුකම් (වෘත්තීය හා කාර්මික) පිළිබඳ විස්තර : ————.

12. චරිත සහතික දී ඇති අයගේ නම සහ තනතුරු (එම සහතික වල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඈමිනිය යුතුයි. මුල් පිටපත් නො එවිය යුතුයි).

13. කිසියම් අපරාධයකට උසාවියක් මගින් වරදකරුවෙකු කරනු ලැබුවෙහිද යන වග, එසේ වරදකරුවෙකු කරනු ලැබුවෙහි නම්, දිනය, නඩු නොම්මරය සහ වරදේ ස්වභාවය සඳහන් කරන්න :————.

14. ණය ගැතිකමින් නිදහස් ද යන වග :————.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

# විභාග, විභාග ප්‍රතිඵල

අංකය : 1/60/5 (ජි).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—මාර්තු, 1958

1958 මාර්තු මස පවත්වන්නට යෙදුන ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපෙක්‍ෂක, අපෙක්ෂිකාවන් ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කර ගැනීමට තෝරා ගනු ලැබූ බැව් මෙයින් දැනුම් දෙමි.

| නම | ලිපිනය |
|---|---|
| ඇස්ලින්, ඒ. ඩී. (මෙනෙවිය) | පරගහමුල්ල, වලතර, බේරුවල. |
| ගමගේ, ඩබ්ලිව්. පී. එන්. කේ. | රොන්නදූව, මීපියාගොඩ. |
| ජයතිලක, එස්. බී. | මැතිවරණ කාර්යාලය, කච්චේරිය, මහනුවර. |
| ජිනදාස, අයි. ඩබ්ලිව්. එම්. | පී. සුමනතිස්ස ස්වාමීන් වහන්සේ බාරේ, ගාමිණී විද්‍යාලය, මාලිගාකන්ද, කොළඹ 10. |
| නන්දසේන, එල්. ඩබ්ලිව්. | කච්චේරිය, කළුතර. |
| නාගොඩගේ, ටී. | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, ජීඩ් මාවත, කොළඹ 7. |
| තිලකරත්න, ජී. කේ. ඒ. | 350/1, කැළණිමුල්ල, අංගොඩ. |
| පියසේන, ටී. ඒ. | අරමනාගොල්ල, හොරණ. |
| පෙරේරා, එන්. එන්. (මහත්මිය) | වාණිජ හා වෙළඳ අමාත්‍යාංශය, කොළඹ. |
| පෙරේරා, ඩබ්ලිව්. එල්. එස්. | රජයේ ගබඩා දෙපාර්තමේන්තුව, පාසන්ස් පාර, කොළඹ 1. |
| මහින්ද, ඩබ්ලිව්. ඒ. එන්. | ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ 1. |
| රාජකරුණා, එල්. ඒ. පී. (මෙනෙවිය) | 2/58, වතුරුගම පාර, හෙනරත්ගොඩ, මුදුන්ගොඩ. |
| ලීලාරත්න, ටී. ඒ. | කඹුරුගල්ල, රුග්ගහවිල. |
| විමලසේන, එන්. ඒ. ඩී. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 8. |
| සිරිවර්ධන, ඩබ්ලිව්. කේ. ජී. | මුදල් අමාත්‍යාංශය, කොළඹ 1. |
| සිල්වා, එස්. එච්. ඒ. | 57, අළුත් පාර, අම්බලන්ගොඩ. |
| සුමනාවතී, එස්. (මෙනෙවිය) | විභාග දෙපාර්තමේන්තුව, කොළඹ. |

2. මෙම පිරිමි අපෙක්‍ෂකයින් තුන් අවුරුදු අස්ථිර පත්වීම් ඇතිවද, අපෙක්ෂිකාවන් තුන් අවුරුදු පරීක්‍ෂණ කාල සීමාවක් සහිතව ද පත් කෙරෙනු ඇත. සියලු අපෙක්‍ෂක අපෙක්ෂිකාවන් විසින්ම ලංකාවේ ඕනෑම ප්‍රදෙශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇත් දැයි සෙවීමේ වෛද්‍ය පරීක්‍ෂණයකින් සාමාර්ථය ලැබිය යුතුයි. තවද, ඔවුන් ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1958 නොවැම්බර් මස 4 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

ඒ. බී. අළුවිහාර මහතා 1958 අගෝස්තු මාසයේදී ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා පවත්වන ලද ප්‍රථම කාර්යක්‍ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ බැව් මෙයින් නිවේදනය කරමි.

එස්. ආර්. විජෙයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 ඔක්තෝබර් 31 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**වාගොල්ල කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලීය ගොවිපලට අන්නාසි පැල සැපයීම**

කෑගළු දිසාවේ කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැන විසින්, වාගොල්ල කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලීය ගොවිපලට පහත සඳහන් අන්නාසි පැළ සැපයීම පිණිස සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 2වෙනි දින ප. ව. 2.30 වනතුරු භාරගනු ලැබේ :

(1) කිව් වර්ගයේ අන්නාසි පැළ තුන්දහසයි (3,000).

(2) මුරිසි වර්ගයේ අන්නාසි පැළ තුන්දහසයි (3,000).

2. කෑගළු දිසාවේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා " කෑගළු දිසාවේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි, කෘෂිකර්ම කායර්‍යාලය, කෑගල්ල" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි " වාගොල්ල කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලීය ගොවිපලට අන්නාසි පැළ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර තැපෑලෙන් නොඑව්වොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කෑගළු දිසාවේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි " වාගොල්ල කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලීය ගොවිපලට අන්නාසි පැළ සැපයීම සඳහා ටෙන්ඩර පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු ඉහතකී කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනගෙන් වහාම ඒ ගැණ කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයේ අත්සන් කිරීමට හෝ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් කිසිම වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතුවේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම ටත් පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණක්ය. පත්කරනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජ සන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැණීමේත් බලය කෘෂිකම් අධ්‍යක්‍ෂක තැන වෙත තබාගනී.

11. පත්කරනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුර වැසියෙක්වූ තැනැක්තෙක් ය යන්නයි.

12. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 පරිච්ඡෙද) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. ටෙන්ඩර් කරුට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

14. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්‍ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

15. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

16. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරු විසින් 1959.1.19 වැනි දින හෝ එදිනට පෙර, ඉහත සඳහන් අන්නාසි පැළ වාගොල්ල කෘෂිකම් අභ්‍යාස විද්‍යාලීය ගොවිපළට ගෙනවිත් භාර දිය යුතුයි.

17. වැඩි විස්තර කෑගල්ලේ කෘෂිකම් ව්‍යාප්ත නිලධාරි තැනගෙන් දැනගත හැක.

එම්. එෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්‍ෂ.

1958 නොවැම්බර් මස 3 දින,
පේරාදෙනියේදීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ සහ පොළොන්නරුවේ ගොවිපොලවලට පොල් අතු සහ උණබම්බු සැපයීම

පොළොන්නරුවේ කෘෂිකම් කාර්යාලයේ පරිපාලන නිලධාරිතැන විසින් පහත සඳහන් දේවල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1958 නොවැම්බර් 28 වෙනි දින පස්වරු 3 දක්වා බාරගනු ලැබේ :—

| | | |
|---|---|---|
| (අ) | වියන ලද පොල් අතු—හිඟුරක්ගොඩ ගොවිපල ... | 20,000 |
| | වියන ලද පොල් අතු—පොළොන්නරුව ගොවිපොල ... | 10,000 |
| | (පොල් අත්තක් දිගින් අඩි 6කට වැඩිවද පළලින් අඟල් 13ක්ද විය යුතුයි.) | |
| (ආ) | කහ උණ බම්බු—හිඟුරක්ගොඩ ගොවිපොල ... | 4,000 |
| | (ප්‍රමාණය—උස අඟල් 10යි. අභ්‍යන්තර විෂ්කම්භය අඟල් 4 සහ ඊට වැඩි.) | |
| (ඉ) | යෝධ උණ බම්බු—හිඟුරක්ගොඩ ගොවිපොල ... | 4,000 |
| | (ප්‍රමාණය—උස අඟල් 12යි. අභ්‍යන්තර විෂ්කම්භය අඟල් 5 සහ ඊට වැඩි.) | |

මේ එක් එක් ද්‍රව්‍ය සැපයීම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

2. පොළොන්නරුවේ කෘෂිකම් කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එව්ය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා (අනු පිටපතක්ද සහිතව) සීල් තබා "පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, පොළොන්නරුව" යන්න එහි පිට ලියා එහිම වම් කොණෙහි "පොල් අතු/උණ බම්බු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය", යන්න ලියා එව්ය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එව්ය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනට එවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "පොල්අතු/උණ බම්බු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කළ දිනයේ දී සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පොළොන්නරුවේ කෘෂිකම් කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ (අ) අංකයේ ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 10ක් ද, (ආ) සහ (ඉ) යන එක එක අංකවල ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 5ක් ද තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණ යන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවා වූද දේවල මුලු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකම්ධ්‍යක්‍ෂ තැන නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතු යි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත තබා ගනී.

11. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

12. 1934රේ 19 වැනි අංක දරණ කම්කරු වන්දි ආඥ පණත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩ ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්‍ෂ.

1958ක්වූ නොවැම්බර් මස 3 වැනි දින,
පේරාදෙණියේ දී ය.

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ යුනියන් පෙදෙසෙහි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ කොමාරිය සහ බක්කි ඇල පිහිටි නියමිත මිල යෝජනා ක්‍රමයේ වී ගබඩාවන්ට 1959 සැප්තැම්බර් 30 වැනිදායින් අවසන් වන කාලය දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් 1958 නොවැම්බර් 28 වැනි සිකුරාදා අපරභාග 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. මඩකලපුවේ කච්චේරියට එක් ගබඩාවක් සඳහා රු. 50 බැගින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සි එහි නියෝජ්‍ය ආහාර පාලකතුමාට ඉදිරිපත් කොට ටෙන්ඩර් පත්‍ර 1958 නොවැම්බර් 28 සිකුරාදා දවල් 12 වන තෙක් කාලය තුළදී ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර මඩකලපු කච්චේරියේ නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ මඩකලපුවේ සහකාර ගොවිජන සේවා කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඕන්ස් පාර, කොළඹ 10,
1958.11.7.

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ මරදාන් ඕන්ස් පාර අංක 336 දරණ ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා කොමසාරිස් තුමාගේ කාර්යාලය මගින්, කෑගලු දිස්ත්‍රික්කයේ දේවාලගම නි. මි. යෝ. වී ගබඩාවට 1959 සැප්තැම්බර් මස 30 වැනිදායින් අවසන් කාලය දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ඉල්ලුම් පත් 1958 නොවැම්බර් මස 28 වෙනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

කෑගල්ලේ කච්චේරියට රු. 50ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් එහි නියෝජ්‍ය ආහාර පාලක තුමාට ඉදිරිපත් කොට 1958 නොවැම්බර් 28 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

වැඩි විස්තර කෑගල්ලේ කච්චේරියේ නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ කෑගල්ලේ සහකාර ගොවිජන සේවා කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඕන්ස් පාර,
කොළඹ 10, 1958.11.7.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශය භාර අනුරාධපුරයේ වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් පහත දක්වෙන වැඩ සඳහා, 1958 නොවැම්බර් මස 26 වැනි බදාදා පෙරවරු 9.30 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

(අ) ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලීය ගොඩනැගිල්ල සෑදීම.

(ආ) කණිෂ්ඨ ලිපිකරු නිවාස නො. 9 සහ 10 ගොඩනැඟීම.

(ඉ) අඩි 30 ළිං දෙකක් සෑදු ගලෙන් බැඳීම.

2. වෙන් වශයෙන් ඉදිරිපත් කළයුතු මෙම ටෙන්ඩර් සඳහා දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රු. 50,000 වත් රු. 20,000 වත් සහ රු. 15,000 වත් හෝ වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් සුදුස්සන් වෙත්.

3. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා පෝර්ම කොළ සහ සියලු විස්තර මහකනදරාව වාරිමාර්ග ඉන්ජිනේරු තැන ගෙන් ලබා ගත හැකිය. 1958 නොවැම්බර් 11 වැනි අඟහරුවාදා සිට 22 වැනි සෙනසුරාදා දක්වා පෝර්ම කොළ දෙනු ලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාර්ග කාර්යාලයෙහි එක් සේවයකට රු. 25 බැගින් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන, දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත් කරුවන්ට පමණි.

5. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩකරන ටෙන්ඩර් කරුවන් ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සතුටු දායක ලෙස වැඩ සිදු වෙන බවට සහතික ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාවේදී අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා විසින් ටෙන්ඩර් විවෘත කරනු බැලීමට ටෙන්ඩර් කරුවන්ට පැමිණිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
මහකනදරාව.

අංකය ටී. ජී. 192,
1958 නොවැම්බර් 3 වැනි දින,
මිහින්තලේ.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටාරෝඩියි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග නිලධාරි තැන විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ කල්තොට වාරිමාර්ග ව්‍යාපාරයේ වම් ඇල කැපීම සහ කොන්ක්‍රීට් පෙට්ටි සෑදීම සඳහා 1958ක්වූ නොවැම්බර් මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ඇල කොටස් කර තිබෙන්නේ පළමුවෙනි තැනැක්මේ අඩි 250 සිට අඩි 550 දක්වාද, අඩි 550 සිට අඩි 850 දක්වාද, අඩි 850 සිට අඩි 1,150 දක්වාද, අඩි 1,150 සිට අඩි 1,450 දක්වාද, අඩි 3,200 සිට අඩි 3,700 දක්වා ය.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයෙන් ඉහත සඳහන් කොටස් වලට වෙන වෙනම ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර, පිටපත් දෙක බැගින්, මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර රත්නපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචිවී ඇති එක් කොටසකට රුපියල් පනහක් ටෙන්ඩර් සඳහා කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්නා සිටින කොන්ත්‍රාත් කරුවන්ට 4.11.58 සිට 14.11.58 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
රත්නපුර උප කොට්ඨාශය භාර වාරිමාර්ග
නිලධාරි තැන.

වාරිමාර්ග කාර්යාලය,
රත්නපුර, 1958.10.28.

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බොරැල්ලේ පිහිටි මුළුතැන්ගෙට, බේකරියට සහ නාරාහේන්පිට තිබෙන පලතුරු පිං වල ඇතිරීමේ කර්මාන්ත ශාලාවට පලාපු කුලු සහ රබර් දර 59.1.1 සිට 59.6.30 දක්වා සැපයීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ යුනියන් ප්ලේස්හි පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍ය කාර්යාංශයේ ටෙන්ඩර් බෝඩ් කොමිටියේ සභාපතිතුමා විසින් 58.12.2 වෙනි අඟහරුවාදා අපරභාග 2.30 වෙනතුරු භාරගනු ලැබේ. කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගන්නා ලද පෝරමවල ටෙන්ඩර් සාදා අනුපිටපතක් ද සමඟ එවිය යුතුයි. යථෝක්ත අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 150ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 58.12.2 වෙනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. වැඩි විස්තර අලෙවිකිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවිකිරීමේ සංවර්ධන කොමසාරිස් තුමා
වෙනුවට.

58. 11. 4,
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව,
62, චැතැම් වීදිය, කොළඹ 1.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වෂී 1958ක් වූ දෙසැම්බර් මස 26 වන දින වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. වෂී 1958 ක් වූ දෙසැම්බර් මස 31 වන දින පූර්වභාග 10ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කායඝාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රකාන්ද්‍ර,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1958ක් වූ නොවැම්බර් 7 වන දින,
තැ. පෙ. 540, කොළඹ.

---

## ලුණු දෙපාර්තමේන්තුව

නිලාවැලි ලේවායේ සිට ත්‍රිකුණාමලේ දුම්රිය ස්ථානයට ලොරිවලින් ලුණු ගෙනයාම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤ වීදියේ ජෙනරල්ස් ලේක් පාරේ නො. 110 තැ. පෙ. නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1958 ක් වූ නොවැම්බර් මස 28 වැනි සිකුරාද පස්වරු 3 ට භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොම සාරිස් තැනගේ කායඝාලයෙන් හෝ ත්‍රිකුණාමලේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ නිලාවැලි ලුණු ලේවාය භාරකාර නිලධාරියාගෙන් ලබාගන්නා ලද පෝර්ම කොල වලය.

ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50 ඕනෑම කච්චේරි යක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කලවිට ටැන්ඩර් පෝර්ම කොල දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

අංකය : ඊ. සී. 192.
1958 නොවැම්බර් 7 වැනි දින, කොළඹ.

---

## වන සංරක්ෂක දෙපාර්තමේන්තුව

කොළඹ මැක්ලම් රෝඩ්හි පිහිටි මධ්‍යම දව ගබඩාවට සහ එහි සිට දවදඬු ඇදීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගැනීම වෂී 1958ක් වූ දෙසැම්බර් මස 2වෙනි අඟහරුවාද පෙරවරු 10ට කොළඹ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේදී අවසාන කරනු ලැබේ.

කොළඹ වන සංරක්ෂකතුමා වෙත වෂී 1958ක් වූ නොවැම්බර් මස 28 වැනි දින දවල් 12 වනතුරු රු. 50ක තැන්පත් මුදලක් බැඳීමෙන් ටැන්ඩර් පත්‍ර ලබාගත හැකිය.

වැඩි විස්තර කොළඹ වන සංරක්ෂකතුමාගෙන් ලබාගත හැක.

---

## රේගු දෙපාර්තමේන්තුවේ ගන රත්රන් සහ රන් පවුම් ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් ගන රත්රන් සහ රන් පවුම් විකිණීම සඳහා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමන්ගේ බලය ලත් රජයේ ලියාපදිංචි වී ඇති සවර්ණාභරණ නිපදවන්නන්ගෙන් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ඒ අංක සී. 1228—(i) රන් පොලු 4 යි. (එක පොල්ලක බර තෝලා 10 යි)
(ii) රන් පවුම් 17 යි.
බී අංක සී 1230— රන් පවුම් 331යි.
සී අංක සී 1231— රන් පවුම් 3යි.

2. ටෙන්ඩර් පත් කවරයක බහා හස් (මුද්‍රා) තබා කවරයෙහි වම් ඉහළ කෙළවරේ "ගන රත්රන් සහ රන්පවුම් සඳහා ටෙන්ඩර්" යයි සඳහන් කර කොළඹ ප්‍රධාන රේගු අයකැමි තුමන් නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර් භාර ගැනීම 1958 නොවැම්බර් මස 14 වැනි සිකුරාද පෙරවරු 10ට නිම වෙයි. රේගුවේ නියෝජ්‍ය අයකැමි විසින් ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එය නැරඹීමට අවසර දෙනු ලැබේ.

4 ටෙන්ඩර් පිළිබඳ නියමිත පුරවුපත් (ෆෝරම්ස්) කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිවාරණ නිලධාරි තැනගෙන් ලබා ගත හැක්කේ එක එක පුරවු පතක් සඳහා රු. 100ක් තැන්පත් කිරීමෙනි.

5. කාර්යාල ඇර තබන නියමිත වේලාවන් හි දී මේ රත්රන් පොලු සහ රන් පවුම් පරීක්ෂා කිරීමට හැකිය.

6. ටෙන්ඩර් පත් ගෙනවිත් රේගු කාර්යාලයේ තබා ඇති පෙට්ටි යෙහි තැන්පත් කළ හැකිය. නො එසේ නම් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. කිසිම කරුණක් උදෙසා නියමිත කාලසීමාවෙන් පසුව ටෙන්ඩර් පත් භාර ගනු නො ලැබේ.

7. ගැනුම්කරු විසින් මුළු මුදල ගෙවා රත්රන් රැගෙන යාමට පෙර ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත් බලපත්‍රය ඉදිරිපත් කළයුතු වන්නේ ය.

8. ටැන්ඩර් පිළිබඳ අවශ්‍යතාවන් සපුරා ඇති අයදුම්කරුවන් පුරවු පත් සඳහා තැන්පත් කරන ලද රු. 100 ය, විකිණීම හමාර වූ පසු මේ කාර්යාලයෙන් පෙරලා ලබා ගැනීමට කුවිතාන්සිය සමග ඉල්ලුම් කළ යුතුයි.

9. කිසිදු හේතුවක් නො පෙන්වා ටෙන්ඩර් පත් එකක් හෝ වැඩි ගණනක් භාර නො ගැනීමට හෝ විකිණීම අවලංගු කිරීමට බලය රේගු ප්‍රධාන අයකැමි සතුය.

ජේ. වී. පොන්සේකා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1958 ඔක්තෝබර් මස 29 වැනි දින,
රේගු දෙපාර්තමේන්තුවේ නිවාරණ අංශය,
කොළඹ.

---

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

පහත සඳහන් අමු චිත්‍රපටි සැපයීම සඳහා කොළඹ 1, තැ. පෙට්ටිය 1416 දරණ සෙනෝට් ගොඩනැගිල්ලේ පිහිටි ප්‍රවෘත්ති දෙපාර්ත මේන්තුවේ ප්‍රවත්ති නිලධාරි විසින් 1958 දෙසැම්බර් 9 වැනිදා පෙර වරු 9.30 වන තෙක් ටැන්ඩර් භාර ගනු ලැබේ :—

(අ) මිලිමීටර් 35හේ සම්පූර්ණයෙන් වසන ලද
කාන්දම් චිත්‍රපටි අඩි 1,000 ගේ කැලි-අඩි ... 40,000 යි.

(ආ) මිලිමීටර් 17½ සම්පූර්ණයෙන් වසන ලද සිදුරු
සහිත කාන්දම් චිත්‍රපටි අඩි 1,000 කැලි-අඩි ... 25,000 යි.

2. දෙවෙනි පිටපතෙකින් යුතුව ටැන්ඩර ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 1, සෙනෝට් ගොඩනැගිල්ලේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති නිලධාරියාගෙන් ලබාගත හැකි පෝර්මවලය.

3. 1958 දෙසැම්බර් 8 වැනිදා පස්වරු 2 දක්වා ටැන්ඩර පෝරම නිකුත් කරනු ලැබේ. ඒ සඳහා රු. 50 ක් තැන්පත් කළ බවට රිසිට් ටුවක් ද ඉදිරිපත් කළ යුතුයි. මේ මුදල කොළඹ මහා භාණ්ඩාගාර යේදී හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක දී තැන්පත් කළ හැකි ය.

4. වැඩි විස්තර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් ලැබිය හැකි ය.

ඇම්. ජේ. පෙරේරා,
වැඩ බලන ප්‍රවෘත්ති නිලධාරි.

කොළඹ 1,
තැ. පෙට්ටිය 1416,
සැනෝට් ගොඩනැගිල්ලේ,
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදීය,
1958 නොවැම්බර් මස 3 වැනිදා.

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### ජලය සැපයීමේ යෝජනා ක්‍රමය—නිවිතිගල

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මැදපත්තු ගම්කාර්ය සභාවේ නිවිතිගලට නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සඳහා කොල්ලුපිටියේ වරව් පාරේ අංක 135 දරන ස්ථානයේ පිහිටි පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තැබූ ද්විත්ව ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර 1958 වේ දෙසැම්බර් මස 6 වැනි සෙනසුරාදා උදේ 9.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ කොළඹ පරණ මහ ලේකම් කායඝාලයේ අංක 267 දරණ කාමරයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 100ක මුදලක් තැන්පත්කොට එයට ලැබෙන රිසිට්ටුව ඉදිරිපත් කිරීමෙන් කොළඹ, නෙලුම්පොකුණ පාරේ අංක 54 දරණ ස්ථානයේ පිහිටි ජල කර්මාන්ත ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත් ආකෘති පත්‍රයක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුයි.

3. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ජල කර්මාන්තය සහ කාණු දැමීමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන්ද, කොළඹ නාගරික සභාවේ සභාවේ රුපියල් 50,000කට වඩා තක්සේරු කර ඇති වැඩ සම්බන්ධයෙන් ලියාපදිංචි වූවන්ට 1958වේ නොවැම්බර් මස 28 වැනි සිකුරාද සවස 4 දක්වා ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනවා ඇත. ඉදින් දෙශීය කොන්ත්‍රාත්කරුවන්, ලියාපදිංචි කළ කවරයක ඔවුන්ගේ ටෙන්ඩර් එවීමට අදහස් නොකරතොත් කවරයේ පිටපැත්තේ විශේෂ වැඩයත්, ඔවුන්ගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙලත් සඳහන් කොට ටෙන්ඩර් භාරගැනීමේ බලය ලත් නිලධාරියාවූ කොළඹ ටරව් පාරේ අංක 135 දරණ සථානයේ පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයා වෙත ටෙන්ඩර් භාරදිය යුතුයි.

4. ටෙන්ඩර්කරුවෝ ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ දිනයේ පටන් සති හයක කාලයක් තැබිය යුත්තාහ.

5. ටෙන්ඩර් විවෘත කරන දිනය වූ 1958 වේ දෙසැම්බර මස 6 වැනි දින උදේ 10ට ටෙන්ඩර්කරුවන්ට කොළඹ ටරව් පාරේ අංක 135 දරණ ස්ථානයට පැමිණ සිටිය හැක. කළයුතු වැඩ සහ ඒ පිළිබඳ තොරතුරු විස්තර (ආණ්ඩුවේ නිවාඩු දින හැර) සියලුම සතියේ දවස්වල උදේ 9 සිට සවස 4.30 දක්වාත් සෙනසුරාද දිනවල උදේ 9යේ සිට පස්වරු 1 දක්වාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජල කර්මාන්ත ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන පළාත් පාලන කොමසාරිස්.

---

## ශ්‍රී පාදසථාන මාර්ගීය දෙපස රජයේ ඉඩම් තාවකාලික වෙළඳසැල් (කඩ) සඳහා බදු දීම, 1958-59

මස්කෙලිය හරහා ශ්‍රී පාදසථානයට යන මාර්ගී දෙපස තිබෙන මෙහි දක්වෙන උප ලේඛනයේ සඳහන් රජයේ ඉඩම් 1958-59 වන්දනා කාලයේදී තාවකාලික වෙළඳ සැල් (කඩ) පැවැත්වීම සඳහා බදුදීම පිණිස මුද්‍රාව "සීල්" තබන ලද ඉල්ලුම් පත්‍ර "ටෙන්ඩර්" 1958 නොවැම්බර් 24 වෙනි සඳුද පෙරවරු 9.30 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් භාර ගනු ලැබේ.

2. "ශ්‍රී පාදසථානයට යන මාර්ගීයේ වෙළඳ සැල් දැමීම සඳහා" යන වැකිය ලියුම් කවරයේ ලිය යුතුයි. තවද පහත සඳහන් එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම් පත්‍ර ඉල්ලුම් කරන ඉඩම් කැබැල්ල පැහැදිලිව සඳහන් කොට ඉදිරිපත් කළ යුතුයි.

3. ඉල්ලුම් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

4. ඉල්ලුම් කරන එක එක ඉඩම් කැබැල්ලක් සඳහා රුපියල් 50 ක මුදලක් කච්චේරියේ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයේ ඇමිනිය යුතුයි.

5. ඉල්ලුම් පත්‍රයේ මැකීමක් කොට හෝ වරදක් සද ඇතොත් ඒ සථානයෙහි ඉල්ලුම්කරුගේ අත්සන යෙදිය යුතුයි. ඉල්ලුම් කරන බදු මුදල අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන් කළ යුතුයි. යම් ලෙසකින් අකුරෙන් සඳහන් මුදල ඉලක්කමෙන් සඳහන් කළ මුදලට වෙනස් වේ නම්, නිවැරදි සේ පිළිගනු ලබනුයේ අකුරෙන් සඳහන් මුදලය.

6. මේ විස්තර පත්‍රයෙහි එකදු කොන්දේසියකට අනුකූලතාවයක් නොදක්වන ඉල්ලුම් පත්‍රයක් වේ නම් ඒ සැලකිල්ලට භාජන කරනු නොලැබේ.

7. "ටෙන්ඩර් පිළිබඳ වැරදිකරුවන්ගේ" ලැයිස්තුවෙහි නම සඳහන් කිසිදු ඉල්ලුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ. තවද දැනට බද්දට ලබාගත් ඉඩම් කැබලිවල කඩ සාද ඇති අයගෙන්ද ඔවුන්ගේ නියෝජිතයන් ගෙන්ද ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

8. ඉල්ලුම් පත්‍ර භාරගත් පසු එම ඉල්ලුම්කරු විසින් මුළු මුදලම නොතීසියේ එවීමෙන් දින 7 ක් ඇතුළත තැන්පත් කොට අවශ්‍ය බදු බලපත්‍ර ලබා නොගත්තොත් ඉල්ලුම් පත්‍ර අවලංගු වනු ඇත.

9. ජයග්‍රාහක ඉල්ලුම්කරුට ඉඩම් කැබැල්ල පිළිවෙල කිරීම සඳහා අඩි 30 × 40 ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලක් සුඩ කළ හැක.

10. ජයග්‍රාහක ඉල්ලුම්කරු විසින් රජයේ ඉඩමකින් ලී කැපීම හෝ රජයේ ඉඩමක් අවසර නොලබා එළි කිරීම නොකළ යුතුයි. අවසර නැතිව රජයේ ඉඩමෙන් ලී නොකැපීමේ ආරක්‍ෂා විධිවිධානයක් නියායෙන්, ජයග්‍රාහක ඉල්ලුම්කරු රු. 100 ක මුදලක් කච්චේරියේ තැන්පත් කළ යුතුයි. මේ කොන්දේසිය සතුටුදායක අන්දමින් අනුගමනය කළ හොත්, එසේ තැන්පත් කළ මුදල, බද්ද අවසානයේදී ඉල්ලුම්කරුට ආපසු දෙනු ලැබේ.

11. ජයග්‍රාහක ඉල්ලුම්කරු විදුලි දෙපාර්තමේන්තුව මගින් පොළොව යටින් දමා ඇති විදුලි කම්බි වලට කිසිදු අනතුරක් නොකළ යුතුයි.

12. ජයග්‍රාහක ඉල්ලුම්කරු තමාගේ කඩයේ ඇති කෑම, මැසෑන් ආදී රෝග බෝකරණ සතුන්ගෙන් ප්‍රවේශම්ව තබා ගත යුතුයි. තවද මෙම කෑම වර්ග සහ ඒවා තබා ඇති අන්දම සෞඛ්‍ය නීති රීතින්ට එකඟ විය යුතුයි.

13. සෞඛ්‍ය නිලධාරීන්ගේ උපදෙස් අනුව සෑම කඩයක් වෙනුවෙන් (අඩු ගණනේ සිමෙන්ති ලෑල්ලක් සහිත) එක වැසිකිළියක් වත් තිබිය යුතුයි. ජයග්‍රාහක ඉල්ලුම්කරු මේ කොන්දේසිය මත එක කඩයක් වෙනුවෙන් රු. 75 ක් තැන්පත් කළ යුතුයි. වර්ෂ 1959 ක්වූ පෙබරවාරි මස 10 වැනි දිනට පෙර සෞඛ්‍ය නීති රීතින්ට එකඟව වැසිකිළියක් සද නිමකළහොත් මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. නැතහොත් මේ තැන්පත් කළ මුදල වැසිකිළියක් සෑදීම සඳහා වැය කරනු ඇත. ඉතා අඩුගණනේ වර්ෂ 1959 ක්වූ ජූනි මස 1 වෙනි දිනට පෙර බද්දට ගත් ඉම්ම් කැබැල්ල අත්හැර දැමිය යුතුයි. ජයග්‍රාහක ඉල්ලුම්කරු බද්ද අතහැර දැමීමට පෙර සෞඛ්‍ය නිලධාරීන්ගේ මතයට සරිලන සේ කඩය කඩා දමා, ස්ථානය සුද්ධ පවිත්‍ර කොට වැසිකිළි වළවල් ආදිය වසා දැමිය යුතුයි. මෙසේ නොකළ හොත් රු. 75 තැන්පත් කළ මුදල අවලංගු වේ.

14. ඉල්ලුම් පත්‍රයක කොටස් පිළිගැනීමේ හෝ ඉල්ලුම් පත්‍ර ඇතැමෙක් ප්‍රතික්‍ෂෙප කිරීමේ හෝ ඉල්ලුම් පත්‍ර සියල්ලම ප්‍රතික්‍ෂෙප කිරීමේ අවිවාදත්මක බලය මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා කෙරෙහි පැවරී ඇත.

15. මේ පිළිබඳ වැඩි දුරටත් විස්තර මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති තුමාගෙන් ලබා ගත හැක.

### උපලේඛනය

(1) ගගුලතැන්නේ, තිස්සන්ක ලෙන—ළිඳ අසල පිහිටි ඉඩම.

(2) සීත ගඟුල—විදුලි පහන් කණුව ඉදිරිපිට යූ. බී. විලිසුන්දර මහතාගේ අම්බලමට යාව පිහිටි ඉඩම.

(3) තැන්න—කුරුණෑගල දන්සැලට අඩි 125ක් පහළින් පිහිටි ඉඩම.

(4) තැන්න—කුරුණෑගල දන්සැලට අඩි 7ක් පහළින් පිහිටි ඉඩම.

(5) තැන්න—කුරුණෑගල දන්සැලට අඩි 75ක් ඉහළින් පිහිටි ඉඩම.

(6) ඉදිකටුපහන සහ තැන්නට අතර පිහිටි ඉඩම—විදුලි පහන් කණුව සහ ළිඳ ඉදිරිපිට.

ඒ. තන්එදිරි,
දිසාපතිතුමා වෙනුවට.

1958 නොවැම්බර් මස 3 වෙනි දින,
මහනුවර කච්චේරියේදීය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ වල්ලකඩුකන්දේ නලමගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමය

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරලේ වල්ලකඩුකන්ද ගම පිහිටි ගම් විශාලකිරීම සඳහා දී තිබෙන ඉඩම්වල ජනයාගේ ප්‍රයෝජනය පිණිස නලමගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමය සඳහා ටැන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 1 වෙනි දින පෙරවරු 11 වනතෙක් රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් භාරගනු ලැබේ.

1958 නොවැම්බර් මස 21 වෙනි දින දවල් 12 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගතහැකි ආකෘතිපත්‍රවල ටැන්ඩර ඉදිරිපත්කළ යුතුයි. ටැන්ඩර් ආකෘතිපත්‍ර දෙනුලබන්නේ රත්නපුර කච්චේරියේ රුපියල් 10 (දහයක්) තැන්පත්කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත්කළ පසුවය.

ටැන්ඩර් ඉල්ලුම්පත්‍ර ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැතිනම් කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ටැන්ඩර් පත්‍ර ඔවුන් අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින් පහත සඳහන් අයට භාරදිය හැක.

ටැන්ඩර් ඉල්ලුම්පත්‍ර සීල්තබා පිට කවරයේ ටැන්ඩර් ඉල්ලුම් කරණ වැඩය සඳහන් කිරීම හා තමාගේ නම සහ ලිපිනය එහි සඳහන්කිරීමද අත්‍යාවශ්‍යය.

වැඩය සඳහා ඉල්ලුම්පත්‍ර පිටපත් දෙක බැගින් එවිය යුතුයි. ටැන්ඩර් ඉල්ලුම්පත්‍රවල දෙවෙනි පිටපත පරීක්ෂාකර බැලීමට අවශ්‍ය යයි හැගෙතොත් ටැන්ඩර් මන්ඩලයේ සභාපති තුමාගෙන් ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා ගතහැක.

ටැන්ඩර් ඉල්ලුම්පත්‍ර ගැන සලකා බැලීම පිණිස එදිනම පෙරවරු 10 ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපිටදී ඒවා විවෘත කරනු ලබන හෙයින් ඒවා ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන් සියලුදෙනාම එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටැන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුයි.

ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට පළමු තමා ඉල්ලුම් කරන වැඩය ගැන සියලු විස්තර තමාම පරීක්ෂාකර බලාගත් බැව් ඉල්ලීම ගැන සැලකීමේදී හඟිනු ලැබේ.

වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් ලබාගත හැකි.

එච්. කරුණාජීව,
දිසාපති තැන වේනුවට.

1958 නොවැම්බර් මස 1 වැනි දින,
රත්නපුර කච්චේරියේදීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

වැලිකඩ "රිමාන්ඩ්" හිර ගෙදරට ආහාර පිසීමේ උපකරණ සැපයීම හා ඒවා සවි කිරීම සඳහා 1958වේ ඔක්තෝබර් මස 31 වෙනි දින අංක 11,573 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ටී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

58.11.4,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

දකුණු කොළඹ නගරවලට සපයන ජලය පිරිසිදු කිරීම සඳහා උවමනා කරන උපකරණ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මාර්තු මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ජලය සැපයීම භාර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 6 වෙනි සෙනසුරාදා දවල් 12 වන තෙක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 500ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. තමන්ගේ පලපුරුද්ද ආදිය ගැන කරුණු ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

ජාවත්තේ ආහාර ගබඩාව අළුත්වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ නොවැම්බර් මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කොළඹ බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ නොවැම්බර් මස 21 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ටී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

කොලොන්නාවේ උතුරු කොටසට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ පෙබරවාරි මස 25 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ජලය සැපයීම භාර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ නොවැම්බර් මස 28 වෙනි සිකුරාද දවල් 12 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ", "බී" සහ "සී" යන කොටස් යටතේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. තමන්ගේ පලපුරුද්ද ආදිය ගැන කරුණු ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

මීගමුවට සපයන ජලය පිරිසිදු කිරීමට උවමනා උපකරණ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ පෙබරවාරි මස 11 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ජලය සැපයීම භාර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා පිටපත් තුනක් එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ නොවැම්බර් මස 29 වෙනි සෙනසුරාදා දවල් 12 වන තෙක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. තමන්ගේ පලපුරුද්ද ආදිය ගැන කරුණු ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 10. 28.

පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ මහකන්ද නමැති ස්ථානයට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ජලය සැපයීම භාර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1958වේ නොවැම්බර් මස 21 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ", "බී" සහ 'සී" කොටස් යටතේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. තමන්ගේ පලපුරුද්ද ආදිය ගැන කරුණු ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

මහනුවරට සපයන ජලය පිරිසිදු කිරීම සඳහා උවමනා කරන උපකරණ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ජලය සැපයීම භාර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා පිටපත් තුනක් එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 27 වෙනි සෙනසුරාද දවල් 12 වන තෙක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 500ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. තමන්ගේ පලපුරුද්ද ආදිය ගැන කරුණු ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 10. 28.

---

මාතලේ කච්චේරියේ ගණකාධිකාරි අංශය හා සරප් තැනගේ කාමරය අළුත් වැඩියා කිරීම (ඉතිරි වැඩ) සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ නොවැම්බර් මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාතලේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1958වේ නොවැම්බර් මස 21 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 12,500ට නො අඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

මාතර නගරයට සපයන ජලය පිරිසිදු කිරීම සඳහා උවමනා කරන උපකරණ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ මාර්තු මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ජලය සැපයීම භාර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 27 වෙනි සෙනසුරාද දවල් 12 වන තෙක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. තමන්ගේ පලපුරුද්ද ආදිය ගැන කරුණු ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

දෙල්තොට ආරෝග්‍යශාලාව අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 3 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුයේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1958වේ නොවැම්බර් මස 21 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 40,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 50ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

රුවන්වැල්ල මධ්‍යම පාඨශාලාවේ අතිරේක වැඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ නොවැම්බර් මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අවිස්සාවේල්ල ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ නොවැම්බර් මස 21 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 16,500ට නො අඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ඒ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ. ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58. 11. 4.

---

# බඩු බාහිරාදිය විකිණීම

## රසපරීක්ෂක දෙපාර්තමේන්තුවට අයත් පාවිච්චි කළ නොහැකි ද්‍රව්‍ය වෙන්දේසිය

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය 1958ක්වූ නොවැම්බර් මස 12 වෙනි දින උදේ 10ට රජයේ රසපරීක්ෂක කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ගනු ලැබූ ද්‍රව්‍ය, වෙන්දේසියෙන් පසු වහාම මුදල් ගෙවා රැගෙන යා යුතුයි :—

| | |
|---|---|
| "මෝලියෝ" විශ්ලේෂණ තුලා | 1 |
| "අර්ට්ලින්ගේ" තුලා | 2 |
| විද්‍යුත් උෂ්මක | 1 |
| "පෙට්රි පෙරි" වර්ණවලී දර්ශක | 1 |
| බී. පී. තහඩුවක් සහිත පෙරාණ පීඩක | 1 |
| "අබේගේ" වර්තනාංක මානය | 2 |
| ශුන්‍යකාරක හුළං පෙති | 1 |
| ඇම්ටරය—සම්පීඩන පොම්පය සඳහා අගල් 6යේ මුණත කිත් යුත් | 1 |
| කේන්ද්‍රා අපසාරී යන්ත්‍රය—සෞඛ්‍යමණ්ඩල | 1 |
| පූර්ණරික්ත පොම්පය—ෆ්ලෙන්ගේ සවාඩිකාරය | 1 |
| විද්‍යුත් කේන්ද්‍රා අපසාරී පොම්ප | 1 |
| පූර්ණ රොටර් පොම්ප | 1 |
| විද්‍යුත් මන්ථ උපකරණ | 1 |
| චතුරශ්‍ර විද්‍යුත් උෂ්මක | 1 |
| "විවිල්ගේ" වායු පරිමාණ උෂ්ණත්ව දර්ශක | 1 |
| විද්‍යුත් උදුන් | 2 |
| නිශ්චල ජල සවයංකාරි ආසවන උපකරණ | 1 |
| "අන්ඩ වුඩ්" ටයිප් රයිටර් | 1 |
| උදළු | 1 |
| කේන්ද්‍රාපසාරි යන්ත්‍රය සඳහා යාමක සුවිච්චි | 1 |
| විද්‍යුත් විච්ඡේදනය ක්‍රියා කරවීම සඳහා ධාරානියාමක | 1 |
| ඇල් කටු | 1 |
| "ලේන් වගීයේ" දාහක | 3 |
| උෂ්මක වැලිකෝව | 2 |
| යකඩ රේක්ක | 1 |

ජෝ. ආ. කෝ. සිරිමාන්න,
රජයේ රසපරීක්ෂක තැන.

1958 ඔක්තෝබර් 28 දින,
රජයේ රස පරීක්ෂක කාර්යාලය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සැම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඞ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත **සම්පූර්ණ ගාස්තුවත්** සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඞ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955** ජනවාරි **1** වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සැම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... .... | 120 | 0 |

අඟලේ සැම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සැම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඞ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායසීංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සැම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. **පරණ** ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ, රජයේ ප්‍රකාශන කායසීංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී